**නියමයන් සහ කොන්දේසි - නේෂන්ස් රයිස් ඩිපොසිට් (යූඑස්ඩී) NATIONS RI$E DEPOSIT (USD)**

1. මෙම ස්ථාවර තැන්පතුව ("මෙම තැන්පතුව") නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී ("බැංකුව") විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, වසර දෙකක (02) උපරිම කාලසීමාවක් සඳහා ඇමෙරිකානු ඩොලර් දහදාහක (ඇ.ඩො.10,000/-) අවම ආරම්භක තැන්පතුවකින් විවෘත කරනු ලැබිය හැකිය.

2. මෙම තැන්පතුවේ මුදල් එහි කල් පිරීමේ දිනයට පෙරාතුව ආපසු ලබාගැනීම සිදුකළහොත් එකග වී ඇති පොළී අනුපාතය බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට අඩුකිරීමට බැංකුව විසින් තවදුරටත් සිය අයිතිය රඳවා තබා ගනියි.

3. තැන්පතුවේ දෛනික ශේෂය මත පහත සඳහන් අනුපාතයන්ට පොළිය ගණනය කරනු ලබන අතර, මෙම තැන්පතුවේ කල් පිරීමේ දිනය තෙක් එම පොළිය මෙම තැන්පතුවට මාසිකව බැර කරනු ලැබේ.

   වසර 2 ක් සඳහා ස්ථාවර අනුපාතය• 6%

4. මෙම තැන්පතුවේ කල් පිරීමේ දිනයට පසුව පොලියක් උපචිත වනු නොලැබේ.

5. මෙම ස්ථාවර තැන්පතුව කල් පිරීම මත මුල් මුදල සහ පොලිය බැංකු ගණුදෙනුකරු විසින් ලිඛිතව නම් කරන ගිණුමකට (විදේශ විනිමය රෙගුලාසිවලට යටත්ව.) පැවරීම කරනු ලැබේ.

6. ස්ථාවර තැන්පතුව මත ණය පහසුකම් සැලසීම ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශිය විනිමය රෙගුලාසිවලට යටත්ව සිදුකරනු ලැබේ.

7. බැංකුව විසින් බැංකු ගණුදෙනුකරු වෙත නිකුත් කරන ස්ථාවර තැන්පතු සහතිකය අන් අයට පැවරිය නොහැකිය.

8. මෙම නියමයන් සහ කොන්දේසි කලින් කලට ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය බැංකුව විසින් තවදුරටත් රඳවා තබාගනු ලැබේ. එවැනි ප්‍රතිශෝධනවල දැන්වීම බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි අනුව බැංකු ගණුදෙනුකරු යොමු කරනු ලැබේ.

9. පොළී ගෙවීම් මත අයකළ යුතු රැඳවුම් බද්ද සහ අනෙකුත් අයබදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හෝ තත්කාර්ය සඳහා නීතියෙන් නම් කරන වෙනත් එවැනි බලධාරියෙකු විසින් නියම කරන පරිදි බැංකුව විසින් අඩුකරනු ලැබේ. අදාල බලධාරින් විසින් තදනන්තරව හිමිකම් ඉදිරිපත් කරනු ලැබුවහොත්, නොගෙවූ අයබදු බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට බැංකු ගණුදෙනුකරුගෙන් අයකර ගැනීමට බැංකුවට අයිතිය තිබේ.

10. මෙහි ඊට පටහැනිව කුමක් සඳහන් වුවද, මෙම තැන්පතුව බැංකු ගණුදෙනුකරුගේ යම් වෙනත් ගිණුමක් සමග හෝ බැංකුව සම්බන්ධයෙන් බැංකු ගණුදෙනුකරුගේ යම් වෙනත් බැරකම් සමග හෝ සම්බන්ධ කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට හෝ මෙම තැන්පතුවේ බැරට තිබෙන යම් මුදලක්/මුදල් හුදෙක් එවැනි බැරකම් තථ්‍ය හෝ අවිනිශ්චිත, ප්‍රාථමික හෝ සමපාර්ශ්වික වුව ද නැත ද, යම් වෙනත් ගිණුමක් හෝ යම් වෙනත් කාරණයක් මත බැංකු ගණුදෙනුකරුගෙන් බැංකුවට ලැබිය යුතු යම් මුදලකට/මුදල්වලට එරෙහිව හිලව් කිරීමට හෝ පැවරීමට බැංකු ගණුදෙනුකරුට දැන්වීමක් භාරදීමකින් තොරව, බැංකුව තවදුරටත් අයිතිය රඳවා තබා ගනු ලැබේ.

11. මෙම නියමයන් සහ කොන්දේසි (ඉහත සඳහන් පොලී අනුපාතයල ද ඇතුළුව,) කලින් කලට ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය බැංකුව විසින් තවදුරටත් රඳවා තබාගනු ලැබේ.

12. මීට සම්බන්ධ සියළුම දැන්වීම්, අන්‍යාකාරයෙන් එකග වී ඇත්නම් මිස, බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසිවල දක්වා ඇති අන්දමට ලිඛිතව බැංකු ගණුදෙනුකරුට භාරදෙනු ලැබේ.

13. මෙහි අඩංගු මෙම නියමයන් සහ කොන්දේසිවලට අමතරව, බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසිවල ඇතුළත් නියමයන් සහ කොන්දේසිවලින් බැංකු ගණුදෙනුකරුවන් බැඳී සිටිනු ලැබේ. මෙම නියමයන් සහ කොන්දේසි සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි අතර යම් අනනුකූලතාවක් මතු වූ විටක දී, මෙම නියමයන් සහ කොන්දේසි එවැනි අනනුකූලතාවයේ ප්‍රමාණයට පමණක් බලපැවැත්වෙනු ඇත.

මෙම ලියවිල්ලේ අඩංගු නියමයන් සහ කොන්දේසි මා විසින් කියවා බලා වටහා ගත් අතර, එම නියමයන් සහ කොන්දේසිවලින් බැඳී සිටීමට එකග වෙමි.

බැංකු ගණුදෙනුකරුගේ අත්සන.

.......................................................................................

දිනය:

බැංකු ගණුදෙනුකරුගේ අත්සන.

.......................................................................................

දිනය:

බැංකු ගණුදෙනුකරුගේ අත්සන.

.......................................................................................

දිනය: